# <u>ශ්‍රී ලංකා රේගුව</u>

## <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

**(මෙම දැන්වීම www.customs.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත).**

යාපනය රේගු උප නිවාරණ කාර්යාලය හා පලාලි ගුවන් තොටුපලේ රාජකාරියේ නියුතු රේගු නිළධාරීන්ගේ (කාන්තා/පිරිමි ) නේවාසික පහසුකම් සඳහා පහත පහසුකම්වලින් සමන්විත ගොඩනැගිලි තුනක් 2024.04.01 දින සිට 2026.03.31 දක්වා වසර දෙක(02)ක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

එම ගොඩනැගිලි පහත අංගෝපංගයන්ගෙන් සමන්විත විය යුතු ය.

01. ටයිල් ඇතිරූ ගෙබිමක් හා සිවිලිමක් සහිත විය යුතු අතර යාබද වැසිකිලි පහසුකම් සහිත නානකාමර ටයිල් වලින් සකස් කළ ගොඩනැගිල්ලක් විය යුතුය.
02. කාමර සියල්ලටම හා ආලින්දයට විදුලිපංකා සහ වායුසමීකරණ පහසුකම් තිබිය යුතු ය.
03. ආලින්දයට සෝපාවක් සැපයිය යුතුය.
04. විදුලිබල සහ ජල පහසුකම් සහිත විය යුතුය.
05. ගොඩනැගිල්ල වටා ආරක්ෂිත වැටක් හෝ වට තාප්පයක් සමඟ ගේට්ටු තිබිය යුතු ය.
06. නේවාසිකාගාර ගොඩනැගිලිවල එක් එක් කාමරය සඳහා ඇඳන් 02, රෙදි රාක්ක 02, කාර්යාලීය මේසයක් සහ පුටුවක්, අල්මාරියක් සැපයිය යුතු ය.
07. නේවාසිකාගාරයන් හි මුළුතැන්ගෙය සඳහා ශීතකරණයක් (Refrigerator), වායු උඳුනක් (අවම වශයෙන් දාහකයන් දෙකක්වත් සහිත) (Gas Cooker), විදුලි ඇඹරුම් යන්ත්‍ර (Blender), ක්ෂුද්‍රතරංග උඳුනක් (Microwave oven), විදුලි කේතලයක්, සම්බන්ධතාවය සහිත රූපවාහිනී යන්ත්‍රයක් (Television with connection) විදුලි උපකරණ සපයා මනා ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වාගෙන යායුතු ය.

**01. යාපනය රේගු උප නිවාරණ කාර්යාලය සඳහා ගොඩනැගිල්ල**

- **i)** කන්කසන්තුරෙ පැරණි වරායේ සිට කි.මී. 05 ක් ඇතුලත හෝ ඊට ආසන්නව ප්‍රධාන පාරකට මුහුණ ලා තිබිය යුතු ය.
- **ii)** වර්ග අඩි 2500 – 3000ක ඉඩ පහසුකම් සහිත කාමර 05 ක් සමන්විත විය යුතු ය.
- **iii)** අවම වශයෙන් වාහන 04 ක් පමණ නවතා තැබිය හැකි කොන්ක්‍රීට් කරන ලද බිමක් සහිතවීම
- **iv)** වැසිකිලි හා නාන කාමර 03 ක් තිබිය යුතු ය.
- **v)** කාමර තුනකට ප්‍රමාණවත් වායුසමීකරණ පහසුකම් හා දුරකතන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සඳහා අවශ්‍ය රැහැන් යොදා තිබිය යුතු ය.
- **vi)** රුඳවුම් කුටියක් ( A Cell)
- **vii)** ආරක්ෂිත කුටියක් ( A Strong Room)

**02. පලාලි ගුවන් තොටුපලේ රාජකාරියේ නියුතු රේගු නිළධාරීන්ගේ (පිරිමි) නේවාසික පහසුකම් සඳහා ගොඩනැගිල්ල**

- **i)** කාමර 06 කින් සමන්විත නේවාසිකාගාර ගොඩනැගිල්ලක් විම.
- **ii)** පලාලි ගුවන්තොටුපලේ සිට කි.මී. 20 ක් ඇතුලත හෝ ඊට ආසන්නව ප්‍රධාන පාරට මුහුණ ලා නේවාසික ප්‍රදේශයක පිහිටිය යුතුය.
- **iii)** අවම වශයෙන් වාහන 06 ක් වත් නවතා තැබිය හැකි කොන්ක්‍රීට් කරන ලද බිමක් තිබිය යුතුය.

**03. පලාලි ගුවන් තොටුපලේ රාජකාරියේ නියුතු රේගු නිළධාරීන්ගේ (කාන්තා) නේවාසික පහසුකම් සඳහා ගොඩනැගිල්ල**

- **i)** කාමර 03කින් යුත් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් විය යුතුය.
- **ii)** පලාලි ගුවන්තොටුපලේ සිට කි.මී. 10 ක් ඇතුලත හෝ ඊට ආසන්නව ප්‍රධාන පාරට මුහුණ ලා නේවාසික ප්‍රදේශයක පිහිටිය යුතුය.
- **iii)** අවම වශයෙන් වාහන 05 ක් වත් නවතා තැබිය හැකි කොන්ක්‍රීට් කරන ලද බිමක් තිබිය යුතුය

**<u>කොන්දේසි</u>**

1) මිල ගණන් ඉදිරිපත් කරන භූමිය හා ගොඩනැගිල්ල යම් ආරවුලකට හෝ අධිකරණ ක්‍රියාවලියකට අදාල වන්නක් නොවිය යුතු ය.

2) මිල ගණන් සමඟ පහත ලේඛන/ තොරතුරු සපයා තිබිය යුතු වේ.

- I. ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුවේ සහතික කළ පිටපතක් /මිල ගණන් ඉදිරිපත් කරන්නා භූමියේ හා ගොඩනැගිල්ලේ අයිතිකරු නොවේ නම් අතුරුබදු දීමට නීතිමය ප්‍රතිපාදන සහිත බදු ඔප්පුවේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.
- II. භූමියේ සැලැස්ම
- III. ගොඩනැගිල්ලේ බිම්සැලැස්ම
- IV. ගොඩනැගිලි සංවර්ධනය සඳහා පළාත් පාළන ආයතනය විසින් නිකුත් කළ අනුමතිය
- V. ගොඩනැගිල්ල සඳහා පළාත් පාළන ආයතනය විසින් නිකුත් කළ අනුකූලතා සහතිකය
- VI. ගොඩනැගිල්ලේ පවතින පහසුකම්
- VII. මාසික කුලිය (රුපියල්)
- VIII. ගෘහභාණ්ඩ ලයිස්තුව
- IX. ආසන්නතම පෙර මාසයේ නිරවුල් කරන ලද පාරිභෝගික බිල්වල පිටපත්
- X. වෙනත් (විස්තර කරන්න)

02. ගිවිසුම් ගත කාළසීමාවට අදාල ව ජල හා විදුලිය ඇතුලත් පාරිභෝගික බිල්පත් ශ්‍රී ලංකා රේගුව මගින් නිරවුල් කරනු ඇත.

03. බදුකරු විසින් පළාත් පාළන ආයතන වෙත වෙත ගෙවිය යුතු වරිපනම් ආදි බදු හා ගාස්තු දැරිය යුතු වේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 21ක් ඇතුලත බදු/කුලී ගිවිසුම් සඳහා එළඹිය යුතු අතර ඒ සඳහා ඊට අදාල වියදම් බදුකරු විසින් දැරිය යුතු වේ.

05. ගිවිසුම් ගත කාළසීමාව සඳහා ගොඩනැගිල්ලේ හා රථගාලේ හා පරිහරණ අයිතිය ශ්‍රී ලංකා රේගුව සතු විය යුතුය. එසේ වුවද, ගොඩනැගිල්ල හා රථගාල හැර භූමිය මැනවින් නඩත්තු කර පවත්වාගෙනයාම බදුකරුගේ වගකීමකි.

06. ගිවිසුම් ගත කාළසීමාවේ රුපියල් 25000/- නොඉක්මවන අලුත්වැඩියා කටයුතු ශ්‍රී ලංකා රේගුව ඉටු කරනු ඇති අතර රුපියල් 25000/- ඉක්මවන අලුත්වැඩියා කටයුතු බදුකරු විසින් ඉටු කළ යුතු වේ.

07. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් බහා මුද්‍රාතබන ලද කවරයේ වම් පස ඉහල කෙලවරේ **යාපනය රේගු උප නිවාරණ කාර්යාලය, පලාලි ගුවන්තොටුපලේ රේගු නේවාසිකාගාරය (පිරිමි ), පලාලි ගුවන්තොටුපලේ රේගු නේවාසිකාගාරය (කාන්තා )** අතුරින් ඔබ විසින් මිළ ගණන් ඉදිරිපත් කරන්නේ කුමක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. මෙය ප්‍රසම්පාදන තුන(03)ක් ලෙස සලකා කටයුතු කරන බැවින් එකකට වඩා වැඩි ගණනකට මිළ ගණන් ඉදිරිපත් කරන්නේ නම් ඒවා ද වෙන වෙනම කවරවල බහා ඉහත 07.හි උපදෙස් පරිදි ඉදිරිපත් කළ යුතු ය.

09. මුද්‍රා තබන ලද මිල ගණන් **රේගු අධ්‍යක්ෂ, සේවා සැපයීම් අංශය, 6 වන මහල, රේගු මන්දිරය, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11** යන ලිපිනයට 2024.03.04 දින ප.ව.2.00ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ හැකි අතර නොඑසේ නම් රේගු මන්දිරයේ 6 වන මහලේ පිහිටි සේවා සැපයීම් අංශයේ තබා ඇති අදාල ප්‍රසම්පාදන පෙට්ටියට බහාලිය යුතුය.

10. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලබන අතර එම අවස්ථාව සඳහා ගොඩනැගිලි අයිතිකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

11. මිළ ගණන් ඉදිරිපත් කළ ගොඩනැගිලිවල යෝග්‍යතාවය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්/ අධ්‍යක්ෂ (සේවා සැපයීම්) හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සේවා සැපයීම්) ස්ථානීය පරීක්ෂාවකින් අනතුරුව තීරණය කෙරෙනු ඇත.

12. ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

13. වැඩිදුර තොරතුරු අංක 011 – 2221680 දුරකථන මාර්ගයෙන් රේගු අධ්‍යක්ෂ (සේවා සැපයීම්) වෙතින් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මූලස්ථානය
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.